සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය I -II	කාලය / நேரம் / Time: පැය 03යි. / மூ. 10යි.

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

සැලකිය යුතුයි:
- අමතර කියවීම් කාලය මිනිත්තු 10යි.
- අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා, තේරුම් ගැනීමටත් පිළිතුරු ලිවීමේදී ප්‍රමුඛත්වය ලබා දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

උපදෙස් :
- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සැපයන්න.
- අංක **(01)** සිට **(40)** තෙක් ප්‍රශ්නවල දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් <u>නිවැරදි හෝ වඩාත් ගැළපෙන</u> පිළිතුර තෝරා ගෙන පිළිතුරු පත්‍රයේ (x) ලකුණ යොදන්න.

---

1. අර්ථ බාධකයක් විය හැක්කේ,
   (1) ඝෝෂාව වැඩිවීම ය.
   (2) පත්‍රිකාවක අක්ෂර බොඳ වීම ය.
   (3) ලේඛනයක ප්‍රාදේශීය භාෂා වචන වැඩිපුර භාවිත වීම ය.
   (4) විදුලි කෙටීම නිසා මාධ්‍ය උපකරණය විසන්ධි කිරීම ය.

2. මානව පරිණාමය අනුව මුල්ම සන්නිවේදන ක්‍රමය,
   (1) පුද්ගලාන්තර සන්නිවේදනය නම් වේ.
   (2) අවාචික සන්නිවේදනය නම් වේ.
   (3) විධිමත් සන්නිවේදනය නම් වේ.
   (4) දෘශ්‍ය සන්නිවේදනය නම් වේ.

3. පරිගණකයක දෘඩාංග (Hard ware) යනුවෙන් හැඳින්වෙන්නේ,
   (1) භෞතික වශයෙන් පරිගණකය සැකසීමට යොදාගන්නා කොටස් ය.
   (2) පරිගණකයේ මොළය හා විද්‍යුත් සංවේදී කොටස් ය.
   (3) රසායනික වශයෙන් පරිගණකය සැකසීමට යොදා ගන්නා කොටස් ය.
   (4) අන්තර්ජාලය හා සම්බන්ධ වීමට යොදාගන්නා කාර්මික කොටස් ය.

Past Papers Wiki

4. පුවත්පතක දැන්වීම් අංශය හා කර්තෘ මණ්ඩලය අතර පවත්නා සබඳතාව පෙන්වා දෙන වගන්තිය තෝරන්න.

(1) පුවත්පතකට දැන්වීම් භාරගනු ලබන්නේ කර්තෘ මණ්ඩල නිර්දේශය අනුව යි.

(2) දැන්වීම් අංශය තෝරා දෙන දැන්වීම් පළ කරන පුවත්පත් ස්ථානය තීරණය කරන්නේ කර්තෘ මණ්ඩලය යි.

(3) දැන්වීම් අංශය ප්‍රධාන කර්තෘ යටතේ ඇති පුවත්පත් අංශයක් නොවනු ඇත.

(4) ප්‍රධාන කර්තෘ ලිපිවලට ඉඩ වෙන් කිරීම අවසන් වූ පසුව දැන්වීම අංශය තම ඉඩ කඩ සීමාවන් තෝරාගනු ඇත.

5. ලොව ඕනෑම සමාජයක **"සමාජ පන්ති"** නිර්මාණය වීමට බලපාන ප්‍රධාන සාධකය,

(1) ආරෝපිත සමාජ තත්ව ඇතිවීම ය.

(2) සමාජ විෂමතා තත්ව ඇතිවීම ය.

(3) ආර්ථික සාධකවල විෂමතා ඇතිවීම ය.

(4) සමාජ සංසටිටන ස්වභාවයන් ඇති වීම ය.

6. වර්ණ ඡායාරූපකරණයේ දී යොදා ගනු ලබන මූලික වර්ණ තුන විය හැක්කේ,

(1) රතු - නිල් - කහ

(2) සයන් - කහ - මැජෙන්ටා

(3) දේදුන්නේ සියලු වර්ණ

(4) රතු - කොළ - නිල්

7. සෘජු ඉදිරිපත් කිරීම් පසෙකලා ආකර්ෂණීය ලෙස ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ වාර්තාකරණය,

(1) සෘජු වාර්තාකරණය ලෙස හඳුන්වයි.

(2) නිර්මාණාත්මක වාර්තාකරණය ලෙස හඳුන්වයි.

(3) ගවේෂණාත්මක වාර්තාකරණය ලෙස හඳුන්වයි.

(4) බුද්ධිකලම්බන වාර්තාකරණය ලෙස හඳුන්වයි.

8. පුවත්පතක අන්තර්ගතය හා සබැඳි පහත තත්ත්ව විමර්ශනය කරන්න.

A - හාස්‍ය රසය පදනම් කරගෙන සමාජ - දේශපාලන තත්ත්ව සියුම්ව විවේචනය කරයි.

B - අවධාරිත හා බලපෑමට මුල් තැනක් දෙමින් ප්‍රකාශ රචනා කරයි.

C - පුවත්පතේ සමාජ - ආර්ථික - දේශපාලන නියෝජනය මැනවින් හඳුනාගත හැකි ශාස්ත්‍රීය ප්‍රකාශනයකි.

ඉහත ප්‍රකාශ සඳහා අදාළ වන පුවත්පත් අන්තර්ගත ආකෘති දක්වා ඇති පිළිතුර තෝරන්න.

(1) කාටූන් - විශේෂාංග - තීරු ලිපි වේ.

(2) ප්‍රවෘත්ති - ඡායාරූප වාර්තා - වෙළඳ දැන්වීම් වේ.

(3) වාර්තා කථන - තීරු ලිපි - විශේෂාංග ලිපි වේ.

(4) කාටූන් - ප්‍රවෘත්ති - සංස්කාරක වැකිය වේ.

9. එක් පුද්ගලයෙකු විසින් කරනු ලබන සෘජු වාචික ඉදිරිපත් කිරීම හා සම්බන්ධ ගුවන් විදුලි වැඩසටහන් ආකෘතිය,

(1) විචිත්‍රාංග නම් වේ.
(2) වාර්තාකථන නම් වේ.
(3) කථා නම් වේ.
(4) වාර්තාමය නම් වේ.

10. ඕනෑම රූපවාහිනී /සිනමා නිෂ්පාදනයක ප්‍රධාන පියවර තුනක් ඇත. ඒවා නම්,

- තිර පිටපත් රචනය
- රූගත කිරීම
- සංස්කරණය

මෙම පියවර තුනට අදාළව යෙදුම්වල නිවැරදි අනුපිළිවෙළ දක්වා ඇති වරණය තෝරන්න.

(1) නිෂ්පාදනය - පූර්ව නිෂ්පාදනය, පසු නිෂ්පාදනය
(2) පූර්ව නිෂ්පාදනය - නිෂ්පාදනය - පසු නිෂ්පාදනය
(3) පූර්ව නිෂ්පාදනය - පසු නිෂ්පාදනය - නිෂ්පාදනය
(4) පසු නිෂ්පාදනය -පූර්ව නිෂ්පාදනය - නිෂ්පාදනය

11. අවාචික සන්නිවේදනයේ පාරිසරික සාධකය හා **නොගැළපෙන** වගන්තිය විය හැක්කේ,

(1) අවාචික සන්නිවේදනයේ දී පරිසරය එකම සාධකය ලෙස සලකනු ඇත.
(2) පරිසරය අනුව පුද්ගල අනන්‍යතාව වෙනස් වනු ඇත.
(3) රැකියා ක්ෂේත්‍රය ද පාරිසරික සාධකවලට ම අයත් වනු ඇත.
(4) පුද්ගලයකුගේ ප්‍රධානත්වය හැඟවීමට ද පරිසර සාධකය යොදාගත හැකි වනු ඇත.

12. විභාග කොමසාරිස් ජනරාල්තුමිය 2004 සා.පෙළ විභාග ප්‍රතිඵල නිකුත් වූ බව ජාතික රූපවාහිනිය ඔස්සේ සියලු විභාග අපේක්ෂකයන් අමතා ප්‍රකාශ කළ අතර, එකී ප්‍රතිඵල අපේක්ෂාවෙන් සිටි පාසල් අයදුම්කරුවන් තම ප්‍රතිඵල අතත්‍ය සන්නිවේදන ක්‍රම ඔස්සේ සෙවීමට උත්සුක විය... (ජයමිණ පුවත්පත)
මෙම සිද්ධිය සමග ගැළපිය හැකි සන්නිවේදන අර්ථ දැක්වීම ඉදිරිපත් කරන ලද්දේ,

(1) පෝල් ඩී. මැසිනියර් ය.
(2) මිල්ටන් බ්‍රෂ් ය.
(3) විල්බර් ශ්‍රාම් ය.
(4) හැරල් ඩී. ලැස්වේල් ය.

13. සෑම පුරවැසියෙකුට ම
(අ) භාෂණයේ නිදහසට හා ප්‍රකාශනය ඇතුළු අදහස් පළ කිරීමේ නිදහසට හිමිකම් ඇත්තේ ය..."

ඉහත ප්‍රකාශය සඳහන් ස්ථානය

(1) එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් ප්‍රඥප්තියේ 19 වන වගන්තියේ ය.
(2) ශ්‍රී ලංකා පුවත්පත් මණ්ඩල පනතේ 14 වන පරිච්ඡේදයේ ය.
(3) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ (1978) 14 වන ව්‍යවස්ථාවේ ය.
(4) තොරතුරු පනතේ 20 වන අනු පරිච්ඡේදයේ ය.

14. අතින් පිටපත් කර පොත් ලිවීම කළ කාල පරිච්ඡේදයේ දී ඒ සඳහා යොදාගත් පිරිස හැඳින්වෙන්නේ,

(1) ශාස්ත්‍රඥයින් ලෙස ය.
(2) වහලුන් ලෙස ය.
(3) ප්‍රභූවරුන් ලෙස ය.
(4) එම්පදෝරු රජවරුන් ලෙස ය.

15. විචාරශීලී ග්‍රාහකයා සෑම විට ම,

(1) ජනමාධ්‍ය ග්‍රාහක සමාජවල නිෂ්ක්‍රීය දායකත්වය ප්‍රතික්ෂේප කරයි.
(2) ජනමාධ්‍ය අන්තර්ගතය පිළිබඳ ස්වකීය මතයේ ස්ථිරව එල්බගෙන සිටී.
(3) ගෘහස්ථ ජනමාධ්‍ය පාලනයකින් තොරව ප්‍රතික්ෂේප කරයි.
(4) ජනමාධ්‍ය විෂය පථය ප්‍රාථමික මට්ටමේ දැනුමක් ලබා ගෙන සිටී.

16. සුළු පරිමාණ මුද්‍රණ කාර්යයක් සඳහා DTP ක්‍රියාවලිය යොදා ගැනීම පිළිබඳ සා.පෙළ සිසුන් සිව් දෙනෙක් ප්‍රකාශ කළ අදහස් පහත පරිදි ය.

A - ක්ෂණිකව සංශෝධනය කළ හැකි ය.
B - කෙටි කලකින් මුද්‍රිත පිටපතක් ලබාගත හැකි ය.
C - නැවත නැවත පිටපත් ලබා ගත හැකි ය.
D - උපරිම මිනිස් බලයක් අවශ්‍ය වන ක්‍රියාවලියකි.

මෙම ප්‍රකාශ අතුරින්,

(1) A, B, D පමණක් සත්‍ය වේ.
(2) B, C, D පමණක් සත්‍ය වේ.
(3) A, B, C පමණක් සත්‍ය වේ.
(4) A, B, C, D යන ප්‍රකාශ සියල්ල ම අසත්‍ය වේ.

17. සන්නිවේදන මූලිකාංග පිළිබඳ අධ්‍යයනයක යෙදුණු සිසුන් පිරිසක් පහත වාර්තාව තබන ලදී.

විවිධ සංදේශ අපේක්ෂාවෙන් සිටී. සංජානන තත්ත්ව නිසා ග්‍රහණය කරගන්නා කරුණු විකෘති කර ගනී. නිරන්තරයෙන් ම සන්නිවේදන බාධකවලට මුහුණ දේ.

ඔවුන් හඳුනාගත් සන්නිවේදන මූලිකාංගය,

(1) සන්නිවේදකයා නම් වේ.
(2) ග්‍රහකයා නම් වේ.
(3) බලපෑම නම් වේ.
(4) ප්‍රතිපෝෂණය නම් වේ.

18. පහත ප්‍රකාශ අතුරින් **වඩාත් නිවැරදි** ප්‍රකාශය තෝරන්න.

(1) මානවයා තොරතුරු ලබා ගැනීමේ මාර්ග ඒක රේඛීය වේ.
(2) සෑම ආරංචියක් ම ප්‍රවෘත්තියක් වේ.
(3) මාධ්‍ය යනු තොරතුරු අලෙවිය පාදක කරගත් ව්‍යාපාරයක් වේ.
(4) අභව්‍ය සිද්ධි මාධ්‍යයෙන් වාර්තා කිරීම වාරණයට ලක් වේ.

19. නිර්මාණාත්මක සන්නිවේදනයේ දී,

(1) ශ්‍රව්‍ය ප්‍රකාශනයක් ලෙස වගු/ ප්‍රස්තාර යොදා ගනු ඇත.

(2) සංවේදී බව නිර්මාණයකට අනිවාර්යය සාධකයක් නොවනු ඇත.

(3) එකම ස්වරූපයකින් ඉදිරිපත් කිරීමක් හැම විටම දැකිය හැකි වනු ඇත.

(4) ගැමි නිර්මාණය තුළ විශ්වාස, අගනාකම් පද්ධතිය තදින් මිශ්‍ර වී ඇත.

20. ජනමාධ්‍ය රාජ්‍ය සතුව පැවතීම හා සම්බන්ධ **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) සංවර්ධන ක්‍රියාවලියට අදාළ තොරතුරු වාර්තා කළ හැකි වීම.

(2) රජයේ පැවැත්ම තහවුරු කර ගත හැකි වීම.

(3) ජනමතය ගොඩනැංවීමට භාවිත කළ හැකි වීම.

(4) දිගු කාලීන ජාතික අපේක්ෂාවන් සමාජගත කිරීමට හැකිවීම.

21. ගුවන් විදුලියේ දුබලතාවයකි,

(1) ක්ෂණික මාධ්‍යයක් වීම යි.

(2) සැනින් අසන්නන් වෙත යොමුවීම යි.

(3) ශබ්ද පාදක මාධ්‍යයක් වීම යි.

(4) භූගෝලීය බාධක විරල වීම යි.

22. මිනිසෙකු සහිත ලොව මුල්ම ඡායාරූපය ලබා ගත්තේ,

(1) විලියම් ෆොක්ස් ටැල්බොට් ය.

(2) ජෝර්ජ් ඊස්ට්මන් ය.

(3) ජොසප් නිසෙපොර් ය.

(4) ලුයිස් මෑන්ඩේ ඩිගියුරේ ය.

23. විචාරශීලී ග්‍රාහකයන් ජනමාධ්‍ය සංදේශවලට ප්‍රතිචාර දැක්වීමේ දී අවම අවධානයක් යොමු කළ යුතු කරුණ,

(1) සමාජයට වන බලපෑම වඩාත් ඉස්මතු කිරීම ය.

(2) මාධ්‍යයේ න්‍යාය පත්‍රය සමාජයට නිරාවරණය කිරීම ය.

(3) නරඹන ග්‍රාහකයන්ගේ අවධානය තමා කෙරෙහි දිනා ගැනීමට ක්‍රියා කිරීම ය.

(4) මාධ්‍ය සංදේශවල අන්තර්ගත ප්‍රබලතා විවරණය කිරීම ය.

24. ආර්ථික නියෝජනය යටතේ වැඩ ලෝකය ඊට සම්බන්ධ එක් ක්ෂේත්‍රයකි,

A - අධ්‍යාපනය හා වැඩලෝකය අතර සම්බන්ධය අවම වීම = මෙම සාධක දෙක අතර නොගැළපීම.


B - වැඩලෝකය අධ්‍යාපනයට වඩා වේගයෙන් නවීකරණය වීම = වැඩ ලෝකයට ගැළපෙන ආකල්ප හා හැකියා සංවර්ධනය

C - වැඩ ලෝකයට අවශ්‍ය පරිදි සංවිධානය = තරුණ පිරිස විශේෂයෙන් නොදැන සිටීම.

මෙහි පළමුවැන්නේ වැඩිවීම දෙවැන්නට බලපාන්නේ කවර යුගලයන් ද තෝරන්න.

(1) A පමණි. (2) B පමණි. (3) A හා C පමණි. (4) A හා B පමණි.

PAST PAPERS WIKI



25. මෙම කිරණ සටහන අනුව කැමරාකරු භාවිත කළ යුතු කාච වර්ගය,

(1) සාමාන්‍ය කාච නම් වේ.
(2) පුලුල් කෝණ කාච නම් වේ.
(3) පටු කෝණ කාච නම් වේ.
(4) විෂම රූපී කෝණ කාච නම් වේ.

26. පහත ප්‍රකාශ අතුරෙන් **සාවද්‍ය** ප්‍රකාශය තෝරන්න.

(1) රූපවාහිනී මාධ්‍ය සඳහා ද විශේෂ වූ විවිධ වැඩසටහන් ප්‍රභේද දැක ගත හැකි ය.
(2) විවිධාංගික ටෙලි නාට්‍ය ප්‍රභේදයේ දී එකම තේමාව යටතේ සැකසුණු කොටස් ගණනාවක් තිබෙන ආකාරය දැක ගත හැකි ය.
(3) සෞන්දර්යාත්මක බව හා ප්‍රවෘත්ති ස්වභාවය මිශ්‍ර වූ වැඩසටහන් ද රූපවාහිනියෙන් විකාශනය වන ආකාරය දැකගත හැකි ය.
(4) යුගයේ ජනප්‍රියම රූපවාහිනී විචිත්‍රාංගය ලෙස යථාකාර (Reality)රූපවාහිනී වැඩසටහන හැඳින්විය හැකි ය.

27. බ්‍රිතාන්‍ය යටත් විජිතයක ස්ථාපනය කරන ලද ප්‍රථම ගුවන් විදුලි සේවය නිල වශයෙන් විවෘත කරන ලද්දේ,

(1) 1925 දෙසැම්බර් 16 වන දිනයේදී ය.
(2) 1920 අගෝස්තු 20 වන දිනයේදී ය.
(3) 1924 ජුනි 12 වන දිනයේදී ය.
(4) 1949 ඔක්තෝබර් 05 වන දිනයේදී ය.

28. කාර්යාලයකට ලිපියක් ලැබීමේ සිට ඊට පිළිතුරු ලිපියක් යැවීම දක්වා භාවිත උපකරණ පිළිවෙලින්,

(1) දින මුද්‍රාව ⟶ නිල මුද්‍රාව ⟶ පරිගණකය ⟶ තැපැල් මුද්‍රාව
(2) තැපැල් මුද්‍රාව ⟶ දින මුද්‍රාව ⟶ පරිගණකය ⟶ නිල මුද්‍රාව
(3) දින මුද්‍රාව ⟶ පරිගණකය ⟶ නිල මුද්‍රාව ⟶ තැපැල් මුද්‍රාව
(4) පරිගණකය ⟶ නිල මුද්‍රාව ⟶ දින මුද්‍රාව ⟶ තැපැල් මුද්‍රාව

29. විද්‍යුත් ජනමාධ්‍ය මඟින් ප්‍රචාරය කෙරෙන දැන්වීමක ගාස්තුව තීරණය කිරීමට **බලනොපාන්නේ**,

(1) දැන්වීම ඉදිරිපත් කරන අවස්ථාව හා වේලාව යි.
(2) දැන්වීම ප්‍රචාරයට ගනු ලබන කාලය යි.
(3) දැන්වීම විකාශනය කරන මාධ්‍ය නාලිකාවේ ව්‍යාප්තිය යි.
(4) ප්‍රචාරක දැන්වීමේ අන්තර්ගතය යි.

30. සුහුරු ජංගම දුරකථනය හා සම්බන්ධ **විද්‍යුත් මාධ්‍ය** ක්‍රියාවලියකි,

(1) විද්‍යුත් තැපැල් පණිවිඩ පරීක්ෂා කිරීම ය.
(2) ඡායාරූප ලබා ගැනීම ය.
(3) ගුවන් විදුලි සේවා ශ්‍රවණය කිරීම ය.
(4) කෙටි පණිවිඩ පුවත් ලබා ගැනීම ය.

31. "යම්කිසි තොරතුරක් පිළිබඳ මහජනතාව වෙත ඍජුව දැනුම්දීම සඳහා අතින් අත බෙදා හරින මුද්‍රිත පත්‍රිකාව..."

(1) අත්පත්‍රිකාව නම් වේ.
(2) පෝස්ටරය නම් වේ.
(3) සඟරාව නම් වේ.
(4) පොත් පිංච නම් වේ.

32. නිර්මාණයක් පිළිබඳ සා.පෙළ සිසුන් සතර දෙනෙක් දැක්වූ අදහස් පහත දැක්වේ.

A - නිර්මාණය තුළ ව්‍යංගාර්ථයන් අන්තර්ගත කළ නො හැකි ය.
B - සාර්ථක නිර්මාණයක් වීමට නම් නැවුම් බව අත්‍යවශ්‍ය ය.
C - නිර්මාණය තුළ නිර්මාණකරුගේ පුද්ගලික මත අන්තර්ගත විය හැකි ය.
D - ප්‍රඥාව වර්ධනයට වඩා ආනන්දය ලබාදීව සෑම නිර්මාණයකම කාර්ය විය යුතු ය.

මේ අතරින් සත්‍ය ප්‍රකාශය වන්නේ,

(1) A හා B පමණි.
(2) B හා C පමණි.
(3) C හා D පමණි.
(4) A හා D පමණි.

33. විමල් ජනමාධ්‍ය ක්‍රියාකාරීත්වය ගැන යම් නිරීක්ෂණයක සිටින අයෙකි. ඔහු විවිධ වැඩසටහන් දෛනිකව නරඹන අතර, එහි අන්තර්ගතය පිළිබඳ කාර්යාලයේ දී පමණක් විග්‍රහ කිරීම පුරුද්දක් කරගෙන සිටියේ ය. .... මේ අනුව විමල්,

(1) උදාසීන ග්‍රාහකයෙකි.
(2) අක්‍රීය ග්‍රාහකයෙකි.
(3) සක්‍රීය ග්‍රාහකයෙකි.
(4) විචාරශීලී ග්‍රාහකයෙකි.

34. පුවත්පතේ අන්තර්ගතය හා **නොගැළපෙන** ප්‍රකාශය තෝරන්න.

(1) පුවත්පතේ නිර්මාණශීලී ආකෘති බහුලව භාවිත වේ.
(2) පුවත්පතක පෙළ (Text)වලට වාක්‍ය හා ඡේද අයත් වේ.
(3) පුවත්පත් අන්තර්ගතයට මුද්‍රණ ශිල්පීය විවිධතාද අයත් වේ.
(4) කාලීන සමාජ ප්‍රවණතා මත පුවත්පත් අන්තර්ගතය වෙනස් නොවේ.

35. "එකක් බෙරේ, දෙකක් බෙරේ....." මෙය ජාතික පුවත්පතක පළ ජනප්‍රිය සිරස්තලයකි. මේ අයුරින් පුවත් වාර්තා කිරීම,

(1) පුරවැසි වාර්තාකරණය නම් වේ.
(2) අර්ධ වාර්තාකරණය නම් වේ.
(3) නිර්මාණාත්මක වාර්තාකරණය නම් වේ.
(4) ඍජු වාර්තාකරණය නම් වේ.

36. ලොව මුල් වරට ගුවන් විදුලි වැඩසටහනක් ඉදිරිපත් කරන ලද්දේ,

(1) ඇමරිකාවේ වොෂින්ටන් ගුවන් විදුලියෙනි.
(2) රුසියාවේ පීටර්ස්බර්ග් විශ්ව විද්‍යාලයෙනි.
(3) බ්‍රිතාන්‍යයේ රාජ්‍ය ගුවන් විදුලියෙනි.
(4) පිලිපීනයේ වෙරිටාස් ගුවන් විදුලියෙනි.

37. රූපවාහිනී කාටුන් වැඩසටහනක් අතරතුර සෙල්ලම් භාණ්ඩ දැන්වීමක් වැඩිපුර ප්‍රචාරය වන බව දක්නට ලැබිණි. මෙයින් ගත හැකි ප්‍රධාන නිගමනය,

(1) ළමුන්ගේ විනෝදය පිළිබඳ දැඩි සැලකිල්ලක් දක්වන බව ය.

(2) වැඩසටහනේ ඒකාකාරී බවෙන් ළමුන් මුදවා ගන්නා බව ය.

(3) පාරිභෝගික කණ්ඩායමක් ලෙස ළමුන්ගේ වටිනාකම හඳුනාගෙන ඇති බව ය.

(4) ළමුන් ප්‍රියජනක දේම ඉදිරිපත් කිරීමට ක්‍රියා කරන බව ය.

38. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව පුරවැසියා සිය භාෂණයේ හා ප්‍රකාශනයේ නිදහස ඉතා වගකීමෙන් භාවිත කළ යුතුය..... මෙසේ වන්නේ,

(1) රජය ආරක්ෂා කර ගැනීම පුරවැසියාගේ ප්‍රධාන කාර්යයක් වන නිසා ය.

(2) පුරවැසියා නීතිය පිළිපැදීමට බැඳී සිටින නිසා ය.

(3) පුරවැසියා රටේ සංස්කෘතියට අනුගත වීම අනිවාර්යය වන නිසා ය.

(4) රාජ්‍ය පාලකයාට අවනත වීම අනිවාර්යය වන නිසා ය.

39. එක්තරා චිත්‍රපටයක අන්තර්ගත ලක්ෂණ මෙසේය.

- කාලය විනාඩි පහයි.
- ව්‍යුහය ඉතා පටුය. එහෙත් ගැඹුරුය.
- නිශ්චිත අදහස් ප්‍රතිනිර්මාණය කරයි.

මෙම චිත්‍රපට වර්ගය වන්නේ,

(1) වෘත්තාන්ත චිත්‍රපට නම් වේ.

(2) වාර්තාමය චිත්‍රපට නම් වේ.

(3) වෙළඳ ප්‍රචාරක සිනමා පට නම් වේ.

(4) කෙටි චිත්‍රපට නම් වේ.

40. භාෂාත්මක ලිඛිත සන්නිවේදනය සමඟ එකඟ විය හැකි අවම අදහස ඇති වගන්තිය තෝරන්න.

(1) භාෂාත්මක සංදේශයේ අර්ථ පූර්ණය සඳහා ලේඛක හා පාඨක අත්දැකීම් පසුතලය බලපානු ඇත.

(2) භාෂාත්මක සන්නිවේදනය අවාචික සන්නිවේදනය තරම් ම ස්ථීර වූවකි.

(3) ව්‍යාකරණ සම්ප්‍රදායන් බිඳුණු කළ භාෂාත්මක සන්නිවේදනයේ අර්ථයන් ව්‍යාකූල වන්නකි.

(4) ලිඛිත සන්නිවේදන තත්ව හැමවිටම සංදේශයේ කල්පැවැත්ම සෑම විටම තහවුරු කරනු ඇත.

(ලකුණු 1 x 40 =40)

සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2025
இறுதி தவணைப் பரீட்சை - 2025 / Year End Term Test - 2025

ශ්‍රේණිය / தரம் / Grade	11 ශ්‍රේණිය	කාලය / நேரம் / Time
සන්නිවේදනය හා මාධ්‍ය අධ්‍යයනය II		

නම / பெயர் / Name ..... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. .....

B කොටස - රචනා

- **පළමුවැනි** ප්‍රශ්නය හා තෝරාගත් තවත් ප්‍රශ්න **හතරක්** ද ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.
- පළමුවැනි ප්‍රශ්නයට ලකුණු **20** ක් හිමි වන අතර, අනෙකුත් සෑම ප්‍රශ්නයකට ම ලකුණු **10** බැගින් හිමි වේ.

---

1) කෙටි පිළිතුරු සපයන්න.

"සැප පහසු අයුරින් සුරක්ෂිත ගමනාන්තයක් කරා පොදු ප්‍රවාහන සේවා භාවිත කරමු....." යන තේමාව යටතේ ජාතික ගමනාගමන කොමිසමේ සභාපතිතුමාගේ සහභාගිත්වයෙන් ජාතික සම්මන්ත්‍රණයක් පසුගියදා පැවති අතර ඒ ජනමාධ්‍ය හා නව මාධ්‍ය ඔස්සේ ද සජීවීව විකාශය කෙරිණි. වර්තමානයේ බොහෝ තරුණ කොටස් ජනප්‍රිය සංස්කෘතියේ ගොදුරු බවට පත්වීම රිය අනතුරුවලට ද හේතු වී ඇති සෝචනීය තත්ත්වයක් බව සභාපතිතුමා සම්මන්ත්‍රණය අමතා ප්‍රකාශ කළේය.

i. මෙම ජාතික සම්මන්ත්‍රණය අයත් වන සන්නිවේදන වර්ගය නම් කරන්න.
ii. ඉහත දක්වා ඇති තේමාව ප්‍රචාරය කිරීමට දෘශ්‍ය සන්නිවේදන මාධ්‍ය යොදාගත හැකි **ආකාරයක්** කෙටියෙන් පැහැදිලි කරන්න.
iii. අනාරක්ෂිත අයුරින් බස් රථ පදවන රියදුරන් නීතියේ රැහැනට අසුකර ගැනීමට CCTV (පියවූ පරිපථ රූපවාහිනී කැමරා) භාවිත කළ හැකි ආකාර **දෙකක්** ලියා දක්වන්න.
iv. ඡේදයේ දක්වා ඇති තේමාව සමාජයට ප්‍රචාරය කිරීම සඳහා රාජ්‍ය සහ පෞද්ගලික මාධ්‍ය ක්‍රියාකළ යුතු ආකාරයක් **අභිමත ජනමාධ්‍යයකට** විශේෂිතව දක්වන්න.
v. ජනමාධ්‍ය හා නව මාධ්‍ය අතර වූ මූලික වෙනස්කමක් සඳහන් කරන්න.
vi. අඩි දහසකට පෙරළුනු බස්රියක දර්ශන ලබා ගැනීම සඳහා ඩ්‍රෝන කැමරා යොදා ගැනීමේ දී වඩාත් සුදුසු වන්නේ උඩුකෝණී ඡායාරූප ගැනීම ද, යටි කෝණී ඡායාරූප ගැනීම ද... ඔබගේ පිළිතුරා තෝරා ලියන්න. එසේ එම පිළිතුර තෝරා ගැනීමට හේතුව ද සඳහන් කරන්න.
vii. රිය අනතුරක් පුවත්පතකට වාර්තා කිරීමේ දී (සෘජු වාර්තාකරණ ක්‍රමයේ දී) පෝල් D මැසිනියර්ගේ සූත්‍රය යොදා ගත හැකි ආකාරය හඳුන්වා දෙන්න.
viii. මෙම සම්මන්ත්‍රණයේ විස්තර එවෙලෙහිම විද්‍යුත් පුවත්පතක පළවිය... විද්‍යුත් පුවත්පතකට **පමණක්** ආවේණික වූ ලක්ෂණ දෙකක් නම් කරන්න.
ix. මෙකී තේමාව සහිත ඒකාංගික ටෙලි නාට්‍යයක් පසු කලෙක විකාශ කළේය. මෙම නිර්මාණයේ අඩංගු විය යුතු නිර්මාණාත්මක ගුණාංග **දෙකක් කෙටියෙන්** පැහැදිලි කරන්න.
x. හරසුන් වූ තරුණ පරපුර විචාරශීලීන් බවට පත්කිරීමට අදාළ ඔබගේ යෝජනා **දෙකක්** ඉදිරිපත් කරන්න.

(ල. 2x10=20)

Past Papers Wiki

2) මෙවර ජාතික නත්තල් උත්සවයේ දී නිවේදන කටයුතු කිරීමට ඔබ තෝරා ගෙන ඇතැයි සිතන්න. එහිදී වාචික සන්නිවේදනය ප්‍රබලව යොදා ගැනේ.

i. වාචික සන්නිවේදනය යනු කුමක් ද? (ල. 01)

ii. වාචික සන්නිවේදනයේ සාර්ථකත්වය සඳහා අවධානය යොමු කළ යුතු භාෂාව හා සම්බන්ධ අංග **දෙකක්** පිළිබඳ කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

iii. වාචික සන්නිවේදනය හා අවාචික සන්නිවේදනය අතර වූ මූලික වෙනස්කම් **තුනක්** සන්සන්දනාත්මකව පෙන්වා දෙන්න. (ල. 03)

iv. "..... ජාතික උත්සවවල ක්‍රියාත්මක වන්නේ විධිමත් සන්නිවේදනයයි." ඔබ මෙම ප්‍රකාශයට එකඟ වේද? කරුණු හතරක් ඇසුරින් සනාථ කරන්න. (ල. 04)

3) සුහුරු ජංගම දුරකථනය වර්තමානයේ අධ්‍යාපන උපකරණයක් වී ඇත.

i. ලොව පුරා ප්‍රධාන වශයෙන් භාවිත වන දුරකථන **දෙවර්ගය/ ප්‍රභේද දෙක** නම් කරන්න. (ල. 01)

ii. සුහුරු ජංගම දුරකථනයේ (Smart phone) සුවිශේෂිතා **දෙකක්** කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

iii. ඔබ සුහුරු ජංගම දුරකථනය භාවිත කිරීමේ දී පුරවැසිභාවයේ ලක්ෂණ යොදා ගන්නා ආකාරයන් **තුනක්** සවිස්තරව දක්වන්න. (ල. 03)

iv. සුහුරු ජංගම දුරකථනය ඔබගේ අධ්‍යාපන අරමුණු ඉෂ්ට කර ගැනීමට යොදාගන්නා ආකාර හතරක් නිදසුන් සහිතව විස්තර කරන්න. (ල. 04)

4) සන්නිවේදනය වූ කලී තොරතුරු ගනුදෙනුවකි. ඒ තුළ සන්නිවේදන අරමුණු ද අන්තර්ගත වේ.

i. **මූලික** සන්නිවේදන අරමුණු /කාර්යයන් **දෙකක්** නම් කරන්න. (ල. 01)

ii. වර්තමාන ලොව තුළ තොරතුරු රැස් කර තිබෙන පහත ආකාර **දෙක** කෙටියෙන් විස්තර කරන්න.


A - භෞතික ආකාරය

B - පුද්ගල ආකාරය (ල. 02)

iii. විද්‍යාර්ථයෙකු තොරතුරු රැස් කිරීමේ දී සැලකිය යුතු සාධක **තුනක්** පෙන්වා දෙන්න. (ල. 03)

iv. ජනතාවට දෛනිකව තොරතුරු ලබාදෙන පුවත්පත් අන්තර්ගතයේ සුවිශේෂතා රාශියකි. ..... සාධක **හතරක්** විස්තර සහිතව පැහැදිලි කරන්න. (ල. 04)

5)



i. මෙම රූප සටහනට වඩාත් සමීප වන සන්නිවේදන අර්ථ කථනය ඉදිරිපත් කළ විද්වතා නම් කරන්න. (ල. 01)

ii. **"බලපෑම"** වැදගත් සන්නිවේදන මූලිකාංගයක් වීමට හේතු වූ සාධකයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 02)

සියලුම විෂයන්ට අදාල ප්‍රශ්න පත්‍ර/පිළිතුරු පත්‍ර/සටහන් ලබා ගැනීමට Past Papers Wiki වෙත පිවිසෙන්න

iii. ඉහත සන්නිවේදන ආකෘතිය ගුවන් විදුලියට ද ආදේශ කල හැක. පටිගත කර ඉදිරිපත් කළ හැකි ගුවන් විදුලි වැඩසටහන් ආකෘති තුනක් නම්කර, එහි විශේෂතාද විස්තර කරන්න. (ල. 03)

iv. රූපවාහිනී මාධ්‍යයේ සමාජ බලපෑම පහත සඳහන් ශීර්ෂ **දෙක** යටතේ නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න. (ල. 04)

A - රූපවාහිනියේ සංස්කෘතික බලපෑම

B - වෙළෙඳ ප්‍රචාරණයේ අනිසි බලපෑම

6) මාධ්‍ය වාර්තාවකින් උපුටාගත් කොටසක් පහත දැක්වේ.

"මිනිසුන් රණ්ඩු වෙන එක සාමාන්‍ය දෙයක්. පොලිස් වාර්තා අරගෙන බැලුවත් මේ ගැන හොඳට පේනවා. හැම රණ්ඩුවක් ම මාධ්‍යයේ පළ කරන්නේ නෑ.එහෙත් මගේ පුතා රණ්ඩුවක පැටලී අත්අඩංගුවට ගත්තා විතරයි. පත්තර වාර්තාකරුවන් කැමරා උස්සගෙන ඇවිල්ලා වාර්තා කරා.... එහෙම වුණේ මම මේ සමාජයේ ප්‍රභූ (VIP) පුද්ගලයෙකු නිසානේ..."

i. ඉහත සිද්ධිය අරභයා ප්‍රවෘත්ති ඡායාරූපයක් ලබාගන්නා ආකාරය කෙටියෙන් පැහැදිලි කරන්න. (ල. 01)

ii. සමාජ ගැටුම් මානව ධර්මතා විනාශ කරන ආකාරයන් **දෙකක්** සැකෙවින් දක්වන්න. (ල. 02)

iii. ඡේදයේ දක්වන ප්‍රභූ පුද්ගලයාගේ පුතා පොලිස් අත්අඩංගුවට ගැනීම වාර්තා කිරීමේ දී ඥාති සම්බන්ධතාව දැක්වීම, මාධ්‍ය ආචාර ධර්ම හා කෙතරම් දුරට එකඟ වේද? පැහැදිලි කරන්න. (ල. 03)

iv. මෙවැනි පුවත් නිරන්තරයෙන් වාර්තා කරන ගුවන් විදුලිය පරිශීලනය කිරීමෙන් ඔබට ලැබෙන වාසිදායක තත්ව හතරක් නිදසුන් සහිතව පෙන්වා දෙන්න. (ල. 04)

7) විචාරශීලී ග්‍රාහකත්වය ක්‍රියාත්මක කිරීමේ දී මාධ්‍ය විචාරයට ද ඉහළ වටිනාකමක් නිතැතින්ම හිමි වේ. මාධ්‍ය විචාරය කිරීමේ දී සංදේශය හුදෙකලා කොට සැලකීම සාධාරණ නොවන බව කිව යුතුය.

i. "විචාරශීලී ග්‍රාහකත්වය....." යන්න අර්ථ දක්වන්න. (ල. 01)

ii. සංදේශයකින් ඉදිරිපත්වන අදහස කුමක්ද යන්න තීරණය ගැනීමට බලපාන සාධක **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න. (ල. 02)

iii. ජනමාධ්‍ය ග්‍රාහක විවිධතා ඇතිවීමට බලපාන සාධක **තුනක්** පෙන්වා දෙන්න. (ල. 03)

iv. ළමයාට මාධ්‍යයෙන් වන බලපෑම් පහත ශීර්ෂ යටතේ සාකච්ඡා කරන්න. (ල. 04)

A - මධ්‍යයෙන් ඉගෙනීම

B - සෞන්දර්යාත්මක චින්දනයන් ලැබීම

C - ළමයා ප්‍රචණ්ඩත්වයට යොමුවීම

D - ඵලදායී නොවන අපේක්ෂා පසුපස හඹා යෑම.

PAST PAPERS WIKI

WWW.PastPapers.WiKi

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Paper Bank